# ශ්‍රී ලංකාවේ වත්මන් පාසල් අධ්‍යාපන ක්‍රමයේ පවතින සමාජීය ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් නූතන සිංහල කාව්‍ය නිර්මාණ කිහිපයක් ඇසුරෙන්)

*ඩබ්.ආර්.ඒ ඉසුර උදයංගන*[1]

විධිමත් හා අවිධිමත් යන්නෙන් වූ අධ්‍යාපනය පුද්ගල සමාජානුයෝජන ක්‍රියාවලිය සිදු කරයි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට අධ්‍යාපනික කටයුතු සිදු වූ බවට පුරාවිද්‍යාත්මක සාධක සාක්ෂ්‍ය ඇත. සී. ඩබ්. ඩබ් කන්නන්ගර මහතා ඉදිරිපත් කළ 1945 අංක 21 දරන නිදහස් අධ්‍යාපන පනතත් සමග ශ්‍රී ලංකාවේ සෑම අයෙකු සඳහා ම නිදහස් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව හිමි විය. යුග ගණනාවක් ඔස්සේ ඒකාකාරී ව ගලාගෙන ආ කවිය අද්‍යතන යුගයේ දී වෙනස්කම් රාශියකට භාජනය කරමින් මනා ව්‍යුත්පත්තියකින් යුතු වූ නූතන කවියා, එක් කාව්‍ය වස්තු විෂයකට පමණක් සීමා නො වී තම අනුභූතීන් පුළුල් ව සමාජයට විශද කිරීමට නව්‍ය කාව්‍ය ප්‍රස්තුතයන් උපයුක්ත කොට ගන්නා ලදී. එලෙස, අද්‍යතන සිංහල කවියා දක්ෂ ලෙස තම කාව්‍ය වස්තු විෂයන්ට වත්මන් ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්‍රමයේ පවතින සමාජීය ගැටලු උපයුක්ත කර ගැනීමට උත්සුක විය. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් පැවතිය ද එහි පවත්නා සමාජීය ගැටලු පෙන්වා දෙමින් එයින් ළමා පරපුරට වන දැඩි බලපෑම අනාවරණය කිරීමයි. නූතන කවියා අධ්‍යාපනය කාව්‍යට වස්තුවිෂය කර ගත්තේ ඇයි, නූතන පාසල් අධ්‍යාපන ක්‍රමයෙහි කවියා විශද කරන ගැටලු මොනවාද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුවයි. වර්ෂ 2010 - 2022 අතර කාලයේ ශ්‍රී ලාංකීය පාසල් අධ්‍යාපනයේ විෂමතා වස්තු විෂය කර ගනිමින් විරචිත අද්‍යතන සිංහල කාව්‍යයන් කිහිපයක් පමණක් ඇසුරු කිරීම මෙහි පර්යේෂණ සීමාවයි. මෙම පර්යේෂණය පුස්තකාල හා අන්තර්ජාල මූලාශ්‍රය ඔස්සේ ලබා ගත් ද්විතීයක දත්ත පාදක කර ගනිමින් ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයට අනුකූල ව සිදු කරන ලදී. අතීතයේ සිට පැවත එන්නා වූ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වර්තමාන පාසල් අධ්‍යාපනයට සිදු කරන ලද බලපෑම මෙහි දී පැහැදිලි විය. පර්යේෂණයේ ප්‍රතිඵල වසයෙන් නිදහස් අධ්‍යාපනය වුවත් අද වන විට ඍණාත්මක වෙනස්කම්වලට භාජනය වී විභාග ක්‍රමයේ පවතින දැඩි අකාර්යක්ෂම බව නිසා තරගකාරී අධ්‍යාපන රටාවක් නිර්මාණය වී ඇති බව පැහැදිලි විය. පවතින පාසල් අධ්‍යාපන ක්‍රමය ළමුන් සතු කුසලතා යටපත් කරමින් ස්වාර්ථය හඹා යන මනුෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය කරන බව දෘශ්‍යමාන විය. අද්‍යතන සිංහල කවියා ස්වකීය කාව්‍ය නිර්මාණ ඔස්සේ පාසල් අධ්‍යාපන රටාවේ දුර්වලතාවක් ලෙස සැලසුම් සහගත අධ්‍යාපන ප්‍රතිපත්තියක් නොමැති වීම පෙන්වා දී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පවතින සමස්ත අධ්‍යාපන ක්‍රමවේදයේ විධිමත් වූ ප්‍රතිපත්තිමය වෙනසක් සිදු විය යුතු බව මෙම අධ්‍යයනය මඟින් නිගමනය විය.

***ප්‍රමුඛ පද:*** අද්‍යතන සිංහල කවිය; නිදහස් අධ්‍යාපනය; පාසල් අධ්‍යාපනය; වස්තු විෂය; ළමා පරපුර

[1] සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය isururajapaksha30@gmail.com